**දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව**

**-------------------------------**

**කළුතර දිස්ත්‍රික්කය**

**-------------------**

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබද විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 13 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය තුළ හඳුනාගත් ඉඩම් ගොඩනැගිලි 73 ක පිරිවැය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | 2020 වර්ෂයේ නිවැරදි කරන බව දන්වමි. |
| (ii) | වටිනාකම රු.994,679 ක් වූ ඉන්වෙන්ට්‍රි අයිතමයන් 08 ක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | 2020 වර්ෂයේදි අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |
| (iii) | 2018 දෙසැම්බර් 31 දිනැති භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව විකුණූ හා ඉවත් කල අයිතමයන් 81 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | 2020 වර්ෂයේදි අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | සේවක විවේකාගාරය හා සතිපොල කුටි ඉදි කිරීම් ප්‍රාග්ධනිත කිරීමේදී පිළිවෙලින් රු.410,939 ක් හා රු.465,596 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | 2020 වර්ෂයේදි අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |

1.4 අනුකූල නොවීම

------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම

------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | 1988 ප්‍රාදේශීය සභා ) (මූල්‍ය හා පරිපාලන) රීති 218 | | සියළු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් හෝ පරික්ෂා කිරීමට ලක්කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කල යුතුය. | 2020 සැප්තැම්බර් 30 දිනට පෙර මෙම කටයුතු අවසන් කරන බව දන්වමි. |
| (ආ) | 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ගැසට් නිවේදනය | | පරිසර බලපත්‍ර නිකුත් කළයුතු ආයතන 43 ක් සඳහා බලපත්‍ර නිකුත් කර නොතිබුණි. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කල යුතුය. | මෙම කාර්යය යාවත්කාලින කර ඇති බව දන්වමි. |

2. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.20,531,261 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.20,915,086 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

---------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 10,462,000 | 10,027,384 | 9,544,058 | 483,325 | 7,065,000 | 6,842,605 | 6,277,557 | 565,048 |
| (ii) | කුලී | 2,594,000 | 2,720,421 | 2,684,971 | 35,450 | 2,010,000 | 2,056,971 | 1,996,671 | 60,300 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,313,600 | 452,828 | 452,828 | - | 1,076,500 | 795,028 | 795,028 | - |
| (iv) | වෙනත් ආදායම් | 49,828,250 | 39,568,412 | 7,496,751 | 32,071,660 | 37,244,500 | 39,054,749 | 9,174,658 | 29,880,090 |
| | | 64,197,850 | 52,769,045 | 20,178,608 | 32,590,431 | 10,151,500 | 48,749,353 | 18,243,914 | 30,505,438 |

### 2.2.2 ආදායම් රැස් කිරිමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට වු වරිපනම් බදු හිඟය තුල වර්ෂ 01 -03 අතර ඒකක 778 ක් වෙනුවෙන් හිඟ රු.468,015 ක්ද , වර්ෂ 04-10 ත් අතර ඒකක 148 ක් වෙනුවෙන් හිඟ රු.284,338 ක්ද, වර්ෂ 10 ට වැඩි ඒකක 221 ක් වෙනුවෙන් රු.418,239 ක් ද විය. | හිඟ වරිපනම් ආදායම කඩිනමින් අයකර ගත යුතුය. | ඉදිරි මාස කිහිපය තුල මෙම හිඟ මුදලින් අයකර ගත හැකි උපරිමය අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

### 2.2.3 උසාවි දඩ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.21,500,280 ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතුය. | පෙර වර්ෂයන්හි ලැබෙන මුදලට වඩා වැඩි මුදලක් බිල් කිරීම හේතුවෙන් මෙම හිඟය ඇතිවී ඇත. පවතින කෝවිඩ් -19 වසංගත තත්ත්වය තුල මෙම කටයුතු ප්‍රමාද වී ඇත. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගී සේවා, සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය , පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ක්‍රියාකාරි සැලැස්ම | | |
| ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳව විධිමත් ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබුණි. | නිවැරදිව ක්‍රියාකාරි සැලැස්ම සකස් කළ යුතුය. | එකඟ වී ඇති බව දන්වමි. |
| (ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය | | |
| දිරන කසළ සඳහා කොම්පොස්ට් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබුණි. මුළු සභා බල ප්‍රදේශයම ආවරණය වන පරිදි කසළ එකතු කිරීම සිදු නොකරන අතර , කසළ බඳු පැනවීමෙන් රු.260,400 ක ආදායමක් පමණක් ලැබී තිබුණි. ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අතුරු ව්‍යවස්ථාවක් පනවාගෙන නොතිබු අතර , කසළ බැහැර කිරීමේ භූමියට පරිසර බලපත්‍රයක් ද ලබාගෙන නොතිබුණි. තවද වගුරු බිමක් ආශ්‍රිත පරිසර පද්ධතිවලට හානි වන අයුරින් කසළ බැහැර කර තිබුණි. | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත්ව කළ යුතුය. | කසළ කළමනාකරණය සඳහා වන ඉඩමක් නොමැතිවීමේ ගැටළුව මෙම සභාවට ද බලපා ඇත. ඉඩමක් ලබා ගැනීම සඳහා වන ලියවිලි පළාත් පාලන අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ග්‍රාම නිලධාරි වසම් 45 ක් සඳහා කිසිදු ප්‍රජා මණ්ඩලයක් පිහිටුවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රජා මණ්ඩල පිහිටුවා ගත යුතුය. | සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලය මගින් අනුයුක්ත කර ඇති නිලධාරියෙකුට මෙම කාර්යය පවරා තිබුණ ද, එම කාර්යය ඉටු කිරීමට කටයුතු කර නොතිබු බව දන්වමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවක පුරප්පාඩු | | |
| (අ) තනතුරු 07 කට අදාලව පැවති පුරප්පාඩු 07 ක් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අත්‍යවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. | පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බව දන්වමි. |

| | | |
|---|---|---|
| (ආ)පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ආදේශක පදනම මත සේවකයින් බඳවාගෙන වැටුප් ගෙවීම සඳහා රු.983,508 ක් වැය කර තිබුණි. | අනුමත කාර්ය මණ්ඩලය තුල පුරප්පාඩු ඇති හා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඇතිව බඳවා ගැනීම් කළ යුතුය. | මාසික මහ සභා රැස්වීමේදී කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා වන අනුමැතිය ලබාදෙන ලද අතර , ඉදිරි කාලය සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබා දී ඇත. |

3.4 වත්කම් කළමණාකරණය
------------------------------

3.4.1 පුස්තකාල පොත් සමීක්ෂණය
--------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2004 ජනවාරි 26 දිනැති 2004/පුස්/1 ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ සේවා මණ්ඩලයේ චක්‍ර ලේඛයේ 3 වගන්තිය ප්‍රකාරව පුස්තකාල සම්බන්ධ වාර්ෂික තොග සමීක්ෂණය අනිවාර්යෙන්ම පවත්වා සමීක්ෂණ මණ්ඩල වාර්තාව මාස 03 ක් ඇතුළත ක්‍රියාත්මක කල යුතු වුවද, අවසන් වරට පොත් සමීක්ෂණය කල 2017 වර්ෂයේ නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. | 2020 අගෝස්තු 31 දිනට පෙර මෙම කටයුතු අවසන් කිරීමට බලාපොරොත්තු වන බව දන්වමි. |

3.4.2 ආර්ථික නොවූ ගනුදෙනු
----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ටයර් හා ටියුබ් අවශ්‍යතාවය පිලිබඳ නිසි අධ්‍යානයක් සිදු නොකර සමාලෝචිත වර්ෂය තුළදී ටයර් 54 හා ටියුබ් 38 ක් මිලදී ගෙන තිබුණු අතර , ඉන් වර්ෂය අවසානයේදී වටිනාකම රු.813,650 ක් වූ ටයර් හා ටියුබ් 69 ක් භාවිතා නොකර ඉතිරි තොග ලෙස පැවතුණි. | වාර්ෂික අවශ්‍යතාවය සලකා බලා ඒ අනුව මිලදී ගැනීම කල යුතුය. | ඉතිරි ටයර් වලින් ටයර් 10 ක් 2020 වසරේ නිකුත් කර ඇති බව දන්වමි. |

3.4.3 හඳුනාගත් අලාභ
-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.1,858,000 ක් වූ CFL හා LED විදී ලාම්පු කට්ටල 397 මිලදී ගැනීමේදී, ගුණත්වය පිලිබඳ | මිලදී ගැනීම් සිදු කිරිමේදී අවම මිල නොසලකා ගුණත්වය සලකා මිලදී | ආයතන දෙකකින් පමණක් සාම්පල් ලබාදී ඇත. සාම්පල් පරික්ෂා කර මුදල් කමිටු |

| | | |
|---|---|---|
| තහවුරුවක් නොමැතිව, ගුණත්වයෙන් උසස් යැයි සඳහන් කර අවම මිලට වඩා වැඩි මිලකට මුදල් කමිටු නිර්දේශ මත මිලදී ගැනීම නිසා රු.594,450 ක අමතර වියදමක් දරා තිබුණි. | ගන්නේ නම් එය තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා හරහා නිසි පරිදි සනාථ කල යුතුය. | තීරණය ලබාගෙන ඇත. |

3.5 නොවිසඳි ඇති විගණන නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 සැප්තැම්බර් 13 දින පැවති පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් 2011 විගණකාධිපති වාර්තාවේ 2.4(අ) ,(ඊ) හා 2012 විගණකාධිපති වාර්තාවේ 2.1.1 (අ) ඡේද සම්බන්ධයෙන් දි තිබූ නියෝග 2020 ජුනි 01 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | නිවැරදි කිරීම් ක්‍රියා මාර්ග ගත යුතුය. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |